මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2022.01.04

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**Human Rights Commission of Sri Lanka**

සී.ඩී.වික්‍රමරත්න මයා.
පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

**<u>ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සම්බන්ධව</u>**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව.

1. යම් තැනැත්තෙකු සිරභාරයට ගන්නා ලද අවස්ථාවක හෝ රඳවා ගන්නා ලද අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි ඒ සිරභාරයට ගැනීම හෝ රඳවා ගැනීම /රඳවා ගෙන ඇති ස්ථානය. එම වේලාවේ සිට පැය 48ක් නොඉක්මවන කාලයක් තුළ දී දැනුම් දීම.

2. ඉහත ලෙස අත්අඩංගුවට ගෙන රඳවා තබාගෙන ඇති තැනැත්තෙකු හෝ එසේ අත්අඩංගුවට ගත් තැනැත්තෙකු මුදාහැරීමක් හෝ වෙනත් රැඳවුම් ස්ථානයකට මාරු කරනු ලබන විට ඒ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම්දීම කළ යුතුවේ.

ඒ අනුව විවිධ පොලිස් ස්ථානයන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 28 වන වගන්ති ප්‍රකාරව සිදු කරනු ලබන දැනුම්දීම් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අධීක්ෂණය කිරීම සඳහා. අත්අඩංගුවට ගැනීම් පිළිබඳ මාසික ලැයිස්තුවක් අප වෙත ලබාදීමට මෙයින් දැනුම් දෙනු ලැබේ. (ආකෘති පත්‍රය අමුණා ඇත.)

එසේම රඳවා තබාගෙන ඇති තැනැත්තෙකු හෝ එසේ අත්අඩංගුවට ගත් තැනැත්තෙකු මුදාහැරීමක් හෝ වෙනත් රැඳවුම් ස්ථානයකට මාරු කරනු ලබන විට එම දැන්වීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත නිසියාකාරව නොලැබෙන හෙයින් ඒ පිළිබඳ ඔබ නිලධාරීන් දැනුවත් කළ යුතුය. ඒ සඳහා ඔබගේ නිලධාරීන්ට මේ සමග අමුණා ඇති ආකෘති පත්‍රය භාවිත කිරීමට උපදෙස් ලබාදෙන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු රෝහිණී මාරසිංහ.
සභාපතිනි.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
දි/-

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව


ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office: 14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R.A.De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

# ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ( PTA ) යටතේ අත්අඩංගුවට ගෙන රඳවා සිටින රැඳවියන්

## පිළිබඳ වාර්තාව

| නම | ලිපිනය | අත්අඩංගුවට ගැනීමට හේතුව | අත්අඩංගුවට ගත් දිනය හා ස්ථානය | අත්අඩංගුවට ගත් නිලධාරීන් | දැනට රඳවා ඇති ස්ථානය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|---|
| | | | | | | 1. රැඳවුම් නියෝග මත සිටිනතේ නම් රැඳවුම් ස්ථානය. රැඳවුම් අංකය හා රැඳවුම් කාලය.<br><br>2. බන්ධනාගාර ගත කර ඇත්නම් බන්ධනාගාර ගත කල දිනය. රඳවා ඇති බන්ධනාගාරය. නඩු අංකය. නඩුවේ වර්තමාන තත්ත්වය.<br><br>3. නිදහස් කර ඇත්නම් නිදහස් කල දිනය.<br><br>4. ඇප ලබාදී ඇත්නම් ඇප ලබා දුන් දිනය. |